# *Yōgācāra* idealistic concept of *vijññaptimātrā*

යෝගාචාර විඥානවාදි සම්ප්‍රදායානුගත විඥප්තිමාත්‍රතා සංකල්පය

Karapikkada Sobitha

කරපික්කඩ සෝභිත හිමි

නිකායාන්තර බුදුසමයෙහි දාර්ශනික චින්තනයන් විෂයෙහි පදනම් වූ 'ධම්ම' විග්‍රහය තුළ, ථෙරවාදී සම්ප්‍රදායෙහි දැක්වෙන්නා වූ පුද්ගල නෛරාත්මයත්, ධර්ම අස්තීත්වයත් [1] පදනම් වූ ධර්මවාදයත්, ඒ තුළ ඉස්මතු වන්නා වූ "බාහ්‍යාර්ථප්‍රත්‍යක්‍ෂවාදය" නම් වූ දාර්ශනික චින්තනය ද, සර්වාස්තිවාදී සම්ප්‍රදාය දක්වන්නා වූ සර්වකාලීන ධර්ම අස්තීත්වය[2] පදනම් වූ ධර්මවාදී චින්තනය ද, සෞත්‍රාන්තිකයන්ගේ බාහ්‍යාර්ථ අනුමේයවාදය මූලක වූ ධර්ම ක්‍ෂණ භංගුරත්‍වවාදී ආකල්ප ද[3], සර්වකාලීන පුද්ගල අස්තීත්වය මූලික වු පුද්ගලවාදය ද, ප්‍රතික්‍ෂේප කරමින් නිර්මාණය වූ ධර්මතාවාදී චින්තනයක් ලෙස මාධ්‍යමක ශූන්‍යතාවාදය දැක්වේ.

මෙහි දී සියලු පුද්ගලත්වවාදි ආකල්පයන් මෙන්ම ධර්මයන්ගේ ද අස්තීත්වය ප්‍රතික්‍ෂේප වන අතර, ඒ තුළින් ඔවුහු සර්ව ශූන්‍යතාවයක් ඉදිරිපත් කළහ.[4] එසේ වුව ද මෙම මාධ්‍යමක දර්ශනය තුළ ද වන්නා වූ දෝෂයක් වේ. එනම් සර්ව ශූන්‍යත්වයක් ඉදරිපත් වූ කල, එම ශූන්‍යත්වය පිළිබඳ විඥෙය ලැබීම හෙවත් අවබෝධය කෙසේ සිදුවේ ද, යන ගැටළුවයි. මෙම ඌණතාවය මගහරිනු පිණිස ඇති වූ ධර්මතාවාදී චින්තනයක් ලෙස යෝගාචාර විඥානවාදය දැක්වේ. ඒ තුළ සර්ව ශූන්‍යත්වය ප්‍රතික්‍ෂේපිත අතර, ඒ සඳහා බාහ්‍යාර්ථ ශූන්‍යත්වයක් ඉදිරිපත් වේ. ඒ තුළින් ඔවුන් පෙන්වා දෙනුයේ 'විඥාන', 'විඥෙය' යන පදාර්ථයන් තුළ විඥානයෙහි පැවැත්මත් 'විඥෙය' හි නිෂේධනයත් ය. මෙම පදනම මත යෝගාචාර දර්ශනයේ ඉගැන්වෙන්නා වූ මූලික සිද්ධාන්තය විඥප්තිමාත්‍රතාව හෙවත් චිත්තමාත්‍රතාව යි. එනම් ආනුභවික ලෝකය විඥානයෙන් පමණක් නිර්මාණය වූවක් බව දැක්වීමයි.

යෝගාචාර විඥානවාදී දර්ශනය තුළ, එය විඥානවාදයක් දක්වා පෝෂණය කරන්නා වූ ආචාර්ය වසුබන්‍ධු පාදයන් විසින් රචිත විඥප්තිමාත්‍රතාසිද්ධිවාදය තුළ විඥානවාදීන්ගේ මෙම මූලික ඉගැන්වීම පිළිබඳ පූර්ණ විග්‍රහයක් දැකගත හැකිය. මෙම ග්‍රන්ථය ආරම්භ වන්නේ මුළු විෂය ලෝකයම විඥප්තිමාත්‍රයක් බව දක්වමිනි. යම් ආකාරයෙන් තිමිර රෝගයෙන් පෙළෙන මිනිසාට අසත් (සත්‍ය නොවූ) කෙස් ගුලියක්, චන්ද්‍ර මණ්ඩලයක් දර්ශනය වේද, ඒ ආකාරයේ සියලු දෘෂ්ටි විෂයයන් අසත්‍ය වීම නිසා සියල්ල විඥප්තිමාත්‍රයක් වේ. සිත හැරෙන්නට කිසිදු පදාර්ථයක් නොමැත.[5]

වසුබන්ධු පාදයන්ට අනුව බාහිර ලොව සංජානනය කරනු ලබන සිත හෙවත් විඥානය සත් වූවකි. නමුත් සංජානනයට පාත්‍ර වන්නා වූ විෂය වස්තුව සත් වූවක් නොවේ. එය පරිකල්පිතයකි. වසුබන්ධු පාදයන්ගේ යථෝක්ත අදහස ආර්ය ලංකාවතාර සූත්‍රයේ ද දැකගත හැකිය. ''තිමිර පටලයකින් වැසී ඇති, අක්‍ෂි රෝගයකින් පෙළෙන මිනිසා එම රෝගය කරණකොටගෙන අහසෙහි චන්ද්‍ර මණ්ඩලය දකියි. විෂය වස්තු පිළිබඳ බාලයන්ගේ ග්‍රහනය ඒ අයුරින්ම ක්‍රියාත්මක වෙයි.[6]

කණ්ණාඩිය තුළ, ජලය තුළ, ඇස තුළ, භාජනය තුළ, මැණික තුළ ප්‍රතිබිම්බ දක්නට ලැබෙයි. නමුත් ඒවා තුළ ග්‍රහණය කරගතහැකි කිසිවක් දක්නට නොමැත. අහසෙහි ඇති මිරිගුව මෙන් ලොව ඇති විවිධත්වය හුදු පෙනීමක් පමණි. ඒවා විවිධ ස්වරූපවලින් පෙනී සිටින බවත්, ඒවා වඳ ස්ත්‍රියගේ සිහිනයක් තුළ දිස්වෙන දරුවෙකු වැනි යැයි සඳහන් වේ.[7] යථෝක්ත සියලු කරුණුවලින් සනාථ කරනුයේ අප දකින, ශ්‍රවණය කරන, රසවිඳින, ස්පර්ශ කරන භෞතික සත්තාවෙහි නිසරු භාවය යි. භෞතික ලෝකයෙහි ලබන සියලු අනුභූතීන් සිහින ලෝකයක අනුභූතීන්ට සමාන ය. ක්ලේශධර්ම සිහින ලෝකයෙහි මෙන්ම ප්‍රපංච ලෝකයෙහි ද දැකගත හැකිය. නිදසුනක් ලෙස සිහින ලෝකයේ දී අපට කවුරු හෝ පහර දෙයි ද, එවිට මනසෙහි ඇතිවන භීතියත් සැබෑ ලොවෙහි දී දඬුවමකට පරිවර්තනය වේ නම්, ඉන් ඇතිවන භීතියත් පෙන්වා දීමට පිළිවන. ඒ අනුව සිහිනලොව භීතියත් සැබෑලොව භීතියත් එකිනෙකට සමාන වේ. මේ පිළිබඳ අදහස් දක්වන හේන්පිටගෙදර ඤාණසීහ හිමියෝ මෙය නිදසුන් කීපයක් ඔස්සේ විග්‍රහ කොට ඇත.

''මම මගේ පෙම්වතිය සමග අනුරාධපුර රුවන්වැලිසෑය වැඳීමට ගියෙමි. විවිධාකාර වර්ණවත් විදුලි බුබුලින් සෑ මළුව ඒකාලෝකව තිබූ සැටි එම සැන්දෑවේ අපි දුටුවෙමු. සෑ මළුවට පැමිණ වන්දනාකරුවන් හඬ නගා ගාථා කියමින් බුදුන් වඳින හඬ පසුබිමින් අපට ඇසිණි. නන් දෙසින් පැමිණි බැතිමතුන් විසින් දල්වන ලද හඳුන්කූරු කපුරු ආදියෙන් නැගුණු දුමෙහි අපූරු සිත් ගන්නා සුවඳ ද අපට දැණිනි. එක් වන්දනාකරුවෙක් අපට ඉදුණු අඹ ගෙඩියක් පරිත්‍යාග කළේය. මම පෙම්වතිය සමඟ එහි රස බැලුවෙමි. අනතුරුව අත්වැල් බැඳගත් අපි සෑ මළුවෙහි ඇවිද්දෙමු. මගේ පෙම්වතියගේ සුරතෙහි සුමුදු ස්පර්ශය මට හොඳින් දැනින.''

මෙය මා දුටු සිහිනයකි. මා සිහිනයක් දකිමින් සිටින බව යන්තමින් හෝ නොදැනුනි. සැබවින්ම සිදුවන සිද්ධි මාලාවක් මෙන් සියල්ල වින්දනය කළෙමි. එහි කිසිදු අඩුවක් නොදැනිනි. රූප - ශබ්ද - ගන්ධ - ස්පර්ශ - රස යන සාමාන්‍ය ලෝකයේ අරමුණු - අත්දැකීම් කිසිදු වෙනසක් නොමැතිව මගේ සිහින ලොව දී මට ලැබුණි. සිහිනයේ දී ගන්නා අරමුණු මෙන්ම ලබනලද අත්දැකීම් කිසිවක් හෝ මායාවක් පමණක් යැයි හැඟීමක් අල්ප වශයෙන් හෝ ඇති නොවීය. මේ ආකාරයෙන්ම අප අවට ඇතැයි කියන ගස් - ගල් - පර්වත - කඳු - හෙල් - ගංගා - ඇල දොල ඉර - හඳ - අහස - මහ පොළොව - මිනිසුන් - තිරිසනුන් ආදී විවිධාකාර වස්තූන් සත්වයන් මායාවක් යැයි අපි මොහොතකටවත් නොසිතමු. නැති ලෝකයක් ඇතැයි සළකා ගැනීමේ මායාවට ඒ තරමටම අප හසුවී ඇති බැවිනි. අපගේ අත්දැකීම් සමග මුසුවන රූප - ශබ්ද - ගන්ධ - ස්පර්ශ - රස ආදී කිසිවක් සත්‍ය වශයෙන් නැති ව්‍යාජ භ්‍රාන්තීන් යැයි - මානසික නිර්මාණයන්ම යැයි අපි නොපිළිගනිමු. ඒ තරමට අපි බාහිර ලෝකයට රැවටී වසඟ වී සිටින්නෙමු. රැයෙහි නින්දෙහි දී දුටුවේ එක් සිහිනයකි. දිවා රාත්‍රී දෙකෙහිදීම අපි සිහිනයන් දකිමින් සිටිමු.

මම මගේ පෙම්වතිය සමඟ අනුරාධපුරයට ගිය සැටි සිහිනෙන් දුටුවෙමි. එහෙත් සත්‍ය වශයෙන්ම මම එහි නොගියෙමි. මා සිටියේ සවස නිදා ගත් පැදුර මතම ය. මා සමඟ වූ පෙම්වතියක් ද නැත. ඈ සිටියේ මගේ සිතේම ය. විවිධාකාර වර්ණ විදුලි බුබුළු සිත විසින්ම නිමවන ලදී. රුවන්වැලිසෑය ද, වන්දනාකරුවන්ගේ හඬ ද, හඳුන්කූරු කපුරු සුවඳ ද, අඹ ගෙඩියේ රස ද, චිත්ත නිර්මිත ය. මේ සියල්ල චිත්තමාත්‍රකයි. ව්‍යාජ ඒවා යැයි, මායාවන් යැයි මට නොසිතුණි.

දවාලක දී අප සැබෑ සියඹලා කරලක් සැපූ විට දැනෙන ඇඹුල් රසයම සිහිනයේ දී සියඹලා කරලක් සැපූ විට ද දැනේ. අවස්ථා දෙකෙහිම ඇත්තේ ඇඹුල් රසම ය. එහෙත් සිහන දකිද්දී ඇත්ත වශයෙන්ම සියඹලා කරලක් නොවීය. එසේනම් ඇඹුල් රස දැනුනේ කෙසේ ද? යෝගාචාර විඥානවාදී අදහස් අනුව රාත්‍රී සිහිනයේ දී මෙන්ම දවාලයෙහි ද සියඹලා කරල කියා දෙයක් නැත. සියල්ල සිහිනයකි. මායාවකි. සියඹලා සැපීම ද, ඇඹුල් රස ද ඇත්තේ සිත තුළම ය. මේ නිසා සිත හැරුණු විට, විඥානය හැරුණු විට සත්‍ය වශයෙන්ම ලොව පවත්නා කිසිවක් නැත. ඇතැයි අප විසින් සළකනු ලබන බාහිර ලෝකයම මිථ්‍යාවකි. මායාවකි. මෙසේ මුළු මහත් ලෝකයම සිහිනයක් බඳු යැයි කියන විඥානවාදීහු කෙලෙස් නින්දෙන් නිදන්ගතව සිටින අප දිවා රාත්‍රී දෙකෙහිම සිහින දකිමින් පසුවන බව පවසති. යම් දිනක සියලු කෙලෙස් පහවේ. එවිට අපට යථාර්ථය දැකිය හැක. එවිට අපි නින්දෙන් අවදිවෙමු. සිහිනෙන් මිදෙමු. බාහිර ලෝකයම මිථ්‍යාවක් බව එවිට අපි අවධාරණය කර ගනිමු.

සත්‍ය වශයෙන් නැති ලෝකයක් ඇතයි පිළිගන්නා අපි ඇතැම් දෙයක ඇලෙමු. ඇතැම් දේ හෝ පුද්ගලයන් සමග ගැටෙමු. කැමති ප්‍රියජනක දේ ලබා ගැනීමට අපමණ වෙර දරමු. අකමැති අප්‍රියජනක දෙයට එරෙහි වෙමු. එහෙත් ලොව සියලු ක්‍රියාවන් අර්ථ ශුන්‍ය වේ. ලෝකය මායා ස්වරූප වන බැවින් මෙම යථාර්ථ සත්‍ය නියම වශයෙන්ම අවබෝධ කරගත් තැනැත්තා සියලු බාධක වලින් මිදේ. ඒ අනුව විවිධ දුක් කම්කටොළුවලින්, අවුල් වියවුල්වලින් ගහන මෙම විෂම ලෝකය අප විසින්ම නිර්මානය කරගත් මායාවකි. මිථ්‍යාවකි.

නමුත් සත්වාදී දාර්ශනිකයන් නිරන්තරයෙක් අවධාරණය කරන්නේ විෂය වස්තුවත් විඥානයත් දෙකක් ලෙසය. එම නිසා විෂය වස්තුවෙහිත් විඥ්ඥාණයෙහිත් ඇත්තා වූ වෙනස පිළිබඳ ඔවුහු බොහෝ සෙයින් සාකච්ඡා කොට ඇත. නමුත් විඥානවාදීන්ට අනුව විෂය වස්තුව හා ඒ පිළිබඳ විඥානය අතර වෙනසක් ඇතැයි පිළිගැනීමට නම් ඒ දෙක වෙන වෙනම ප්‍රත්‍යක්ෂ කිරීමට හැකි විය යුතුය. නිදසුනක් ලෙස, නිල් පැහැය හා නිල් පැහැය පිළිබඳ දැනුම යන අංශ දෙක අතර වෙනසක් පිළිගත හැක්කේ නිල් පැහැය හා ඒ පිළිබඳ දැනුම වෙන වෙනම ප්‍රත්‍යක්ෂයට ගොදුරු කර ගත හැක්කේ නම් පමණි. එහෙත් මේ දෙකම එක් ක්ෂණයකින් ඇති වෙයි. නිල් පැහැය දකින විටම නිල් පැහැය පිළිබඳ දැනුම ඇති වෙයි. නිල් පැහැය පිළිබඳ දැනුමෙන් ම නිල් පැහැය වටහා ගත යුතු වෙයි. එබැවින් මේ දෙක වෙන වෙනම වටහා ගැනීමේ ක්‍රමයක් නැත. අප විෂය වස්තුවක් ඇතැයි පිළිගන්නේ ඒ පිළිබඳ දැනුමෙනි. එම දැනුමට කලින් දැනුමට පදනම් වූ විෂය වස්තුව පැවතිණිදැයි අපි නොදනිමු. විඥානයත් විඥෙයයත් එකටම පහළ වේ නම්, විඥානයෙන් විඥෙයයේ අන්‍යතරත්වය වටහා ගන්නේ කෙසේද?[8]

විඥානවාදීන්ගේ අන්‍ය වූ සත්වාදීන්ගෙන් කියැවෙනුයේ ප්‍රත්‍යක්ෂ කරන ලද විෂය වස්තුව ප්‍රත්‍යක්ෂ ක්‍රියාමාර්ගයෙන් ස්වාධීනව පවත්නා බවයි. බාහිර ලෝකයේ විෂය පදාර්ථ සත්‍ය වශයෙන්ම පවතියි. විඥානයේ ප්‍රත්‍යක්ෂමය ක්‍රියාමාර්ගය මගින් විෂය වස්තුවට කිසිදු ආකාරයක බලපෑමක් නො කෙරෙයි. ප්‍රත්‍යක්ෂය ආලෝකයට සමාන කළ හැකිය. ආලෝකයෙහි අඳුරෙන් සැඟවී තිබෙන දේ දැකගත හැකිය. එම ආලෝකය ඊට කලින් අඳුරෙහි පැවති විෂය වස්තුවට කවරාකාර වූ හෝ බලපෑමක් නො කරයි. හුදෙක් නිරාවරණය කොට දැක්වීමක් පමණක් කරයි. ආලෝකය අමුතුවෙන් විෂය වස්තු නිර්මාණය නොකරයි. පවත්නා විෂය වස්තුවක් හෙළිකර දැක්වීම පමණක් ආලෝකය

මඟින් සිදුවෙයි. එසේම ප්‍රත්‍යක්ෂයෙන් ද කෙරෙන්නේ විෂය වස්තුව පවත්නා සැටියෙන්ම විදහා දැක්වීමකි. කලින් ප්‍රත්‍යක්ෂ නොකළ විෂය වස්තුවක් ප්‍රත්‍යක්ෂ වනු ලැබීම හැර වෙනත් වෙනසකට පත්නොවී ප්‍රත්‍යක්ෂ ක්‍රියාමාර්ගයට ඇතුළු වෙමින් එහි අනන්‍යතාව ඒ අයුරින්ම පවත්වා ගනියි.[9] ප්‍රත්‍යක්ෂයෙන් විෂය වස්තුව නිරාවරණය වෙයි. නමුත් විෂය වස්තුවට එසේ නිරාවරණය වීමේ අවශ්‍යතාවක් නැත. විෂය වස්තුවේ ස්වභාවය තුළ එය ප්‍රත්‍යක්ෂ ක්‍රියාමාර්ගයකට යොමුකර වීමේ කිසිදු බලපෑමක් නැත. එබැවින් විෂය වස්තුව වූ කලී ඊටම අයත් ලක්ෂණයන් තුළ ස්වාධීනව පවතින්නකි.

සත්වාදීන්ගේ මෙම මතය ප්‍රතික්ෂේප කරමින් විඥානවාදීන් පවසනුයේ ප්‍රත්‍යක්ෂයෙන් බාහිරව විෂය වස්තුව පැවති බව ඔප්පු කළ හැකි විය යුතු බවයි. එහෙත් විෂය වස්තුවක් කලින් පැවති බව ඔප්පු කළ නොහැකිය. ප්‍රත්‍යක්ෂ කිරීම තුළින්ම පමණක් එය සිදුකළ හැකිය. ප්‍රත්‍යක්ෂයට මුහුණ දීමෙන් අනතුරුව මිස ඊට කලින් විෂය වස්තුව අපට දත නොහැකි ය. එබැවින් විෂය හා විෂයි දෙකක් යන මතය ප්‍රතික්ෂේප වෙයි.[10]

සත්වාදීහු විෂය වස්තුව හා ඒ පිළිබඳ දැනුම යන අංශ දෙක වෙන් වෙන්වූ සත්‍යතාවන්ය යන මතය ඔප්පු කිරීම සඳහා විවිධ තර්ක ඉදිරිපත් කරති. ඔවුන්ගේ එක් තර්කයක් වනුයේ විෂය වස්තු භෞතික ලක්ෂණයන්ගෙන් යුක්තය යනුයි. එහෙත් ප්‍රත්‍යක්ෂයට භෞතික ලක්ෂණ නැත. විෂය වස්තුවක් කුඩා හෝ මහත් විය හැකිය. දැඩි හෝ මෘදු විය හැකිය. ඒවා සාපේක්ෂ වශයෙන් එකිනෙකට ඈත් හෝ ලංවිය හැකිය. එහෙත් විඥානයක් ලොකු හෝ කුඩා, දැඩි හෝ මෘදු, දුර හෝ ළඟ යයි කියන්නේ නම් එය විහිළුවකි. විෂය වස්තූන්ට භෞතික විශේෂණ ඇතැයි යන සත්වාදී මතය විඥානවාදීහු ප්‍රතික්ෂේප කරති. මෙය විඥානවාදී ස්ථාවරය නිසිලෙස වටහා නොගැනීම නිසා සත්වාදීන් විසින් ඉදිරිපත් කරන ලද තර්කයකි. විඥානය විෂය වස්තූන් නිර්මාණය කරයි' යන විඥානවාදී මතයෙන් කියැවෙනුයේ විඥානය භෞතික වූ විෂය වස්තු නිර්මාණය කොට බාහිර ලෝකයට ප්‍රධානය කරන බව නොවේ. විඥානයේ එක් එක් ප්‍රකාරයක් අප විෂය වස්තුවක් ලෙස ග්‍රහණය කරමු. විඥානය සෑම මොහොතකම විවිධ වූ ප්‍රකාරයන් හෙවත් ආකාරයන් ප්‍රක්ෂේපනය කරයි. සමුදුරු දිය දහර තුළින් තරංග මතුව එන්නාක් මෙනි. විෂයවස්තු ලෙස වූ බාහිරත්වයක් ඒවාට ඇත ද, ඒවා හුදෙක් විඥානයේ ප්‍රකාරයෝම වෙති. මුහුදෙහි දියදහර හා තරංග අතර වෙනසක් විද්‍යමාන වුව ද තරංග වූ කලී දිය දහරින් වෙනස් වූවක් නොවේ. විෂය වස්තු ලෙස පෙන්වනු ලබන විඥාන ප්‍රකාරයන් නිර්මාණය වීමට වඩා අන්‍ය වූ කාර්යයක් විඥානයට නොමැත.[11]

මෙහි දී අප විසින් අවධාරණය කළ යුතු කරුණක් වන්නේ විඥානයේ සම්භවය විඥානවාදීන් හා සත්වාදීන් විසින් දෙයාකාරයකින් පිළිගෙන ඇති බවයි. සත්වාදීන්ට අනුව විඥානය නිරාකාරය. විඥානයට ප්‍රකාරයන් හෙවත් ආකෘති (Modes) නොමැත. ආකෘති ලෙස අප ප්‍රත්‍යක්ෂ කරන්නේ විෂය වස්තුව සතු ඒවාය. මේවා ඍජුව හා අව්‍යවහිතව විඥානය මඟින් ප්‍රකට කරනු ලැබේ. එහෙත් විඥානවාදීන්ට විඥානය සාකාරය. විඥානයේ අකෘතිම විෂය වස්තු ලෙස පිළිගැනෙයි. විඥානයට අතිරේක වූ සත්තාවක් විඥානවාදීන් නොපිළිගන්නා බැවින්, ප්‍රත්‍යක්ෂ කරන ලද ආකෘති විඥානයට අයත් ඒවා විය යුතුය. විඥානය තමාගේම ආකෘතීන් නිර්මාණය කරයි. විඥානයේ සංධාරය (අන්තර්ගතය) පිටතින් ආනයනය කරන ලද්දක් නොවේ. විඥාන අන්තර්ගතයෙහි පවත්නා වාසනා බීජ මුහුකුරා යමින් රූපාදී වශයෙන් ප්‍රතිභාසාත්මක වන විඥාන ප්‍රවෘත්තියම පමණක් දක්නට ලැබේ.

ඒ හැර රූපාදි වූ විෂය වස්තු නැත. (ස්වබීජ පරිපාකාද් රූපාද්‍යාභාසම් විඥානම් පවර්තතෙ තතු රූපාදීකොර්ථොස්ති)

විඥානයේ කිසිදු බලපෑමකට යටත් නොවී විෂය වස්තුව ස්වාධීනවම පවතී යන සත්වාදී මතය ඛණ්ඩනය කෙරෙන තවත් සාධකයක් ලෙස ස්මෘතියේ ක්‍රියාකාරීත්වය විඥානවාදීන් විසින් ඉදිරිපත් කරනු ලැබේ. ප්‍රත්‍යක්ෂ කළ විෂය වස්තුවක් යළි ස්මරණය කිරීමට අපට හැකි වෙයි. ප්‍රත්‍යක්ෂ කළ විෂය වස්තුවත්, ස්මරණය කෙරෙන විෂය වස්තුවත් අතර වෙනසක් නැත. හුදෙක් නිරාවරණය කිරීමේ කාර්යයට පමණක් විඥානය සීමා වේ නම්, කලින් ප්‍රත්‍යක්ෂ කළ විෂය වස්තුවක් යලි හඳුනාගන්නේ කෙසේ ද, එම විෂය වස්තුව කලින් අප ප්‍රත්‍යක්ෂ කළ එකක් බව අපට නොකියයි. ඒ පිළිබඳව කිසිදු සළකුණක් විෂය වස්තුවේ නැත. විඥානය නිරාකාර වන විට ස්මෘතීන් ජනනය කිරීමට ඊට හැකියාවක් නැති වෙයි. එහෙත් සත්‍ය වශයෙන් ප්‍රත්‍යක්ෂ විෂය වස්තුවක් යළි ස්මරණය කිරීමට හැකිවීමෙන් ඔප්පු වන්නේ විඥානය හුදු නිරාවරණයට පමණක් සීමා නොවන බවයි. විඥානය සාකාරවත් ය. ආකෘති නිර්මාණය කිරීමට විඥානයට හැකි වෙයි. මේ අනුව සත්වාදී මතය බැහැර කෙරෙන බව විඥානවාදීන්ගේ අදහසයි.

සත්වාදී ස්ථාවරය ඛණ්ඩනය කිරීමේ දී භ්‍රමසිද්ධාන්තය ද විඥානවාදී මතයට පක්ෂපාතීව සිටියි. විඥානය තිබෙන දෙයක් ඒ අයුරින්ම දක්වන කැඩපතකට සමාන වේ නම් විෂය වස්තුව විකෘතියට පත් කිරීමට හෝ එහි පවත්නා තත්ත්වය වෙනස් කොට දැක්වීමට විඥානයට හැකියාවක් නැත. ප්‍රත්‍යක්ෂ ක්‍රියාමාර්ගය කිසිදු හැලහැප්පීමකට භාජනය නොවී සියල්ල මනාව ක්‍රමවත්ව සිදුවන තෙක් සත්වාදී මතයට තර්ජනයක් එල්ල නොවෙයි. එහෙත් රැහැන් කැබැල්ලක් සර්පයකු මෙන් දිස්වන විට පවත්නා තත්ත්වය කුමක් ද? අප නුදුරුව සිටිය දී දක්නා විෂය වස්තුව ඈත් වන්නට වන්නට වෙනස්ව දෘෂ්‍යමාන වෙයි. මෙසේ විෂය වස්තුවට නුදුරුව සිටිය දී හා දුරුව සිටිය දී දක්නට ලැබෙන ප්‍රමාණාත්මක වෙනස අප පැහැදිලි කරන්නේ කෙසේ ද? එකම විෂය වස්තුවක් ප්‍රත්‍යක්ෂ කරන දෙදෙනෙක් හෝ වැඩිදෙනෙක් එය සර්වාකාරයෙන්ම ඇති වන අනන්‍යතාවකින් ප්‍රත්‍යක්ෂ නොකරති. එක් එක් පුද්ගලයා ප්‍රත්‍යක්ෂ කරන්නේ තරමක් වෙනස්කම් ඇතිවයි. එහෙත් විෂය වස්තුව විඥානය මඟින් පවත්නා සැටියෙන්ම ප්‍රකට කොට දක්වයි නම්, භ්‍රමය ඇතිවන්නේ කෙසේ ද? එකම විෂය වස්තුව දෙදෙනෙකු වෙනස්කම් ඇතිව ප්‍රත්‍යක්ෂ කරන්නේ කෙසේ ද? යම් යම් වෙනස්කම් ඇතත් එම ප්‍රත්‍යක්ෂයන් මඟින් සමාන නිර්දේශයක් හා පොදු අර්ථයක් ඉදිරිපත් කරන බැවින් විෂය වස්තුව අනන්‍යතාවෙන්ම පවතීයයි සත්වාදීහු මෙහි දී පවසති.[12] නමුත් මේ පොදු හෝ සමාන නිර්දේශ කිසිදිනක ප්‍රත්‍යක්ෂයට ග්‍රහණය කළ නොහැක්කකි.

භ්‍රමය පිළිබඳව සත්වාදීන්ගේ තවත් අදහසක් වන්නේ භ්‍රමයක් ඇතිවීමට වුව ද සත්‍ය වශයෙන් විෂය වස්තුවක් පැවතිය යුතු බවයි. විෂය වස්තුවක් අප භ්‍රමාත්මකව ප්‍රත්‍යක්ෂ කරන්නේ එම විෂය වස්තුව ඊට කලින් අප නිවැරදිව ප්‍රත්‍යක්ෂ කර ඇත්තේ නම් පමණි. සර්පයෙකු කලින් කිසිදිනක දැක නැති පුද්ගලයකුට රැහැන් කැබැල්ලක් අරභයා සර්පයකු යන හැඟීම ඇති නොවෙයි. ස්වප්න අනුභූතියක් නිදසුනකට ගැනීමේ දී වුව ද මේ තත්ත්වයම දක්නට ලැබේ. ඉන්ද්‍රියගෝචර ලෝකයේ කලින් කවදා හෝ ප්‍රත්‍යක්ෂ නොකරන ලද විෂය වස්තුවක් සිහිනයක දී අපට නොපෙනෙයි. එබැවින් ස්වප්න අනුභූතියක් පවා ඇතිවිය හැක්කේ සත්‍ය විෂය වස්තුවක් පිළිබඳ ප්‍රත්‍යක්ෂයක් ඇතිවිට පමණි. සත්වාදීන්ගේ මෙම තර්කයම විඥානවාදීන් විසින් සත්වාදී මතය

බණ්ඩනය කරනු සඳහා උපයෝගී කරගනු ලැබෙයි. භ්‍රමාත්මක සර්ප සංඥාව වූ කලී සර්පයකු පිළිබඳ අනුභූතියක් පිළිබඳ ස්මෘතිය නිසා උද්ගත වන්නකි. ස්මෘතිය යනු හුදෙක් විඥානයට අයත් වූවකි. එසේ නම් භ්‍රමාත්මක සර්ප සංඥාවට හේතු වී ඇත්තේ සත්‍ය වශයෙන් පවත්නා සර්පවකු නොව සර්පයා පිළිබඳ මානසික ආකෘතියකි. එබැවින් විඥානයේ නිර්මාණාත්මක ශක්තිය පිළිගත යුතු වෙයි.

ස්වප්නයක දී අප දකින විෂය වස්තූන්ගේ ස්වභාවයට වඩා අප අවදියෙන් සිටින විට දකින විෂය වස්තූන්ගේ ස්වභාවයෙහි වෙනසක් නැති බව විඥානවාදීන්ගේ අදහස යි. මේ අවස්ථා දෙකෙහිම විෂය වස්තු මානසික නිර්මාණයන්ටම අයත් වන බැවිනි. අපි ස්වප්නයෙහි දී ද අවකාශය තුළ ව්‍යාප්තිමත්ව කාලය තුළ ප්‍රවෘත්ත වන විෂය වස්තු දකිමු. එහෙත් ඒවා අනුභූතියට හසුවීමට වඩා අතිරේක වූ වාස්තවික සත්තාවක් ඒවාට නැත. විඥානවාදීන්ට අනුව ප්‍රබුද්ධ ලෝකයෙහි අපගේ අනුභූතීන්ගේ තත්ත්වය ද මීට වෙනස් නොවේ. ස්වප්නානුභූතියෙහි හා ප්‍රබුද්ධානුභූතියෙහි වෙනසක් නැත්නම් ඒ දෙක වෙන් කොට අප හඳුනා ගන්නේ කෙසේදැයි සත්වාදීහු අසති. ඔවුනට අනුව මේ අනුභූති දෙක අතර වෙනසක් තිබේ. අප ස්වප්නයෙන් අවදි වූ විට ස්වප්නානුභූතිය හුදු මානසික නිර්මාණයක් බව අපි අවබෝධ කරමු. එහෙත් ප්‍රබුද්ධ අනුභූතිය එසේ මානසික නිර්මාණයකැයි වටහා ගැනීමේ ක්‍රමයක් නැත. මේ හැර ප්‍රබුද්ධ අනුභූතියට ගොදුරු වන වස්තු ආනුභවික රීතීන්ට අනුකූලව පවතියි. ඒවා කිසියම් රටාවකට අනුව පවතියි. ස්වප්නානුභූතීන්ට එබඳු ආනුභවික නීතිරීති යටතේ පැවැත්මක් නැත. එබැවින් ආනුභවික විෂය වස්තුවල සත්‍යතාව පිළිගැනීමට සිදුවෙයි.

මෙහිලා විඥානවාදීන්ගේ පිළිතුර වන්නේ සත්වාදීන්ගේ ස්වප්නානුභූති විචාරය කිසිසේත් තම මතයට බලපෑමක් නොකරන බවයි. වෛඥානිකත්වය නීතිරීතීන්ට අනුගත වීම හෝ නොවීම තුළ පවතිතැයි අදහස් නොකළ යුතු ය. නිශ්චිත අවකාශයක් හා කාලයක් තුළ පවතිමින් ආනුභවික නීතිරීතීන්ට අනුගත වීම යමක සත්‍යතාව ඔප්පු කිරීමට සාධකයක් නොවේ. ස්වප්නානුභූතිය ද ඊට ආවේණික වූ නීතිරීති යටතේ පවතියි. ස්වප්න සංසිද්ධීන් වුවද හැම තැනම හැමවිටම සිදු නොවේ. විඥානවාදීන්ට අනුව මේ දෙකෙහි විවිධත්වය පවතින්නේ සත්‍යතාවේ ප්‍රමාණාත්මක වෙනස්කම් අනුව ය. ස්වප්නය සාපේක්ෂ වශයෙන් ප්‍රබුද්ධ අනුභූතියට වඩා සත්‍යාවෙන් හීනය. අනුභූතියක් අත්විඳිනතාක් එහි ඇති වෛඥනිකත්වය හඳුනාගත නොහැකි ය. ස්වප්නය මිථ්‍යාවක් ලෙස ගැනෙන්නේ ස්වප්නයෙන් අත්මිදුනු විට ය. එතෙක් එහි සත්‍යතාව අපි ප්‍රත්‍යක්ෂ කරමු. එසේම අපි ආනුභවිකය යි සලකන ලෝකයෙහි ජනතාව අවිද්‍යාව තුළ සිටින තාක් ආනුභවිකත්වයෙහි පවත්නා මායාත්මක බව වටහා ගනිතැයි අපේක්ෂා කළ නොහැකි ය. යෝගාචාර ශික්ෂණයෙහි දැඩි සේ නියුක්ත වන විශේෂිත පුද්ගලයන් පමණක් හැම දෙයක් ම වෛඥනිකයයි වටහා ගන්නා අතර ආනුභවික අනුභූතීන්හි පවත්නා මායාත්මක බව ද ඔවුහු අවබෝධ කරති. එබඳු පුද්ගලයන්ට පමණක් ලෝකය ස්වප්නයකට වඩා අමුතු නොවේ.

විෂය වස්තුව යනු එය ප්‍රත්‍යක්ෂ කරනුවට වඩා වැඩියමක් නොවේ යන විඥානවාදී මතය සත්වාදීන්ගේ දැඩි විවේචනයට ලක් වූවකි. ස්වප්නයක දී විෂය වස්තු විඥානයෙන් බාහිරව පෙනෙනු ලැබුණත් ඒවා විඥානයේම හුදු ප්‍රක්ෂේපනයන් බව ප්‍රත්‍යක්ෂ කළ නොහැකිය. මෙයම අප ප්‍රබුද්ධව දකින ආනුභවික ලෝකයට ද උපයෝගී කළ හැකි බව විඥානවාදීන්ගේ අදහසයි. සත්වාදීන් පවසන්නේ විඥානවාදී මතය ස්වප්නයේ හා ප්‍රබුද්ධ අනුභූතියේ මූලික වෙනස්කම් ඉක්මවා යන්නක් බවයි. ස්වප්නය හුදෙක් එය දකින පුද්ගලයාට පමණක් සීමා වූවකි. හැම දෙනාටම එකම විටක එකම

සිහිනයක් දැකගත නොහැකිය. එහෙත් ප්‍රබුද්ධ අනුභූතියේ තත්ත්වය මීට වඩා වෙනස් ය.[13] ආනුභවික ලෝකයේ විෂය වස්තුවක් ප්‍රත්‍යක්‍ෂ කිරීම එක් පුද්ගලයකුට පමණක් හිමි වූ වරප්‍රසාදයක් නොවේ. එකම විෂය වස්තුව හැම දෙනාටම ප්‍රත්‍යක්‍ෂ කළ හැකිය. සිහිනයක දී මෙන් ආනුභවික විෂය වස්තු පෞද්ගලික අනුභූතියක් බවට පත් වේ නම්, අනුභූතීන් ලබන පුද්ගලයන්ගේ තරමටම ලෝක සමූහයක් පැවතිය යුතු ය. එමෙන්ම එක් කරුණක් ගැන දෙදෙනෙකුට අදහස් හුවමාරු කර ගැනීමේ ක්‍රමයක් ද නැති වනු ඇත. මෙහිලා විඥානවාදීන්ගේ මතය වන්නේ සත්වාදීන්ගේ ඊනියා පොදු ලෝකය යනු විවිධ චිත්තසන්තානයන්ගේ එකමුතුවක් පමණක් බවයි. පවතිනුයේ ලෝක සාම්‍යයක් පමණි. සෑම විඥානයක් ම තමාගේ ලෝකයක් නිර්මාණය කරයි. එක් කෙනෙකුගේ නිර්මිත ලෝකය හා තවත් කෙනෙකුගේ නිර්මිත ලෝකය ඇතැම් වැදගත් අංශවලින් සමාන වනු මිස සම්පූර්ණයෙන්ම සමාන නොවේ. සැබවින්ම ඇත්තේ ලෝක සාම්‍යයකි. සත්‍ය වශයෙන් මේ ලෝකයෙහි උපලබ්ධ වන්නේ අනන්ත වූ බහුත්වයක් පමණි. විවිධ අනුභූතීන්ගේ ආංශික ඒකීයභාවයෙන් මෙම විෂම සමාජය ජනිතවෙයි. කෙනෙකුගේ ලෝකයට තවත් කෙනෙකුට ඇතුළත් විය නොහැකි බැවින් සුළු සුළු වෙනස්කම් සැලකිල්ලට නොගෙන අමතක කර දැමෙයි. තුලනය කර බැලීමට වෙනත් ක්‍රමයක් නොමැති බැවිනි.

ඥානය ස්වසංවේදීය හෙවත් තමා විසින්ම දැනගනු ලබයි යන විඥානවාදී මතයට එරෙහිව ද සත්වාදීන් විස්තර කරුණු දක්වා ඇත. සත්වාදීන්ට අනුව ඥානය එහි ස්වභාවයෙන්ම යමක් පිළිබඳ ඥානයකි. ඥානය හා යමක් අතර ඇති සම්බන්ධය සැබෑ සම්බන්ධයකි. ඥානය පමණක් පවත්නා එකම සත්තාව නම් ඥානයක් ඇතිවීමේ හැකියාව ද නැති වෙයි. ඉදින් නිල පිළිබඳ ඥානය හුදු සත්තාව නම් හා නිල් පැහැය එම ඥානය සමග තදාත්ම්‍ය වේ නම් එවිට ද්විත්ව කාර්යයක යෙදීමට සිදුවෙයි. එනම් ඥානයට එහි ආකෘතිය (විඥප්තිය) ක් ලෙස නිල් පැහැය ප්‍රක්‍ෂේපනය කරමින්ම එය නිල් පැහැය ලෙස දැනගැනීමට හැකි විය යුතුය. මෙය වෙනත් ලෙසකින් කිවහොත් විෂයී ලෙසත්, විෂය ලෙසත් එකවිට ක්‍රියාත්මක වීමට සිදුවෙයි. මේ දෙක අන්‍යොන්‍ය ප්‍රතිවිරුද්ධ ය. එකම දෙය එකවිටම දැනගන්නා හා දැනගනු ලබන දෙය (ඥෙය) වන්නේ කෙසේ ද? මෙය හරියටම පොරව තමාවම කපාගන්නාක් මෙනි. සත්වාදීන්ගේ මෙම විවේචනයට පිළිතුරු දෙන විඥානවාදීන් සඳහන් කරන්නේ ඥානය යනු එය මඟින්ම ප්‍රක්‍ෂේපනය කරන ලද විශේෂිත අන්තර්ගතයක් ඇති එක් විඥප්තියක් යනුයි. එකම දෙය කෘත්‍ය දෙකක් එකවිට කිරීම පිළිබඳ විඥානවාදී මතයෙන් ප්‍රකාශ කරෙන්නේ විඥානයට තමාවම දැනගැනීමට හැකි වනු පමණක් නොව එය ඕනෑම ඥානයක් ඇති වීම සඳහා අවශ්‍යතාවක් ද වන බවයි. විඥානය විෂය-විෂයී බවට ද්විධාකරණය වෙයි. විෂයී විෂය පදාර්ථ දකිමින්ම එහි ඥානය ගැන ද දැනීමක් ඇතිකරගත යුතුය. මේ කොටස් තුන එකම දෙයක කොටස් හෝ අංග නොවේ. වාස්තවික වීමත් එම (විෂය) වස්තුව ගැන දැනීමත් එකම කෘත්‍යයකි. නිල් පැහැය පිළිබඳ දැනුම වෙනත් දැනුමක් මගින් දත යුතු නොවෙයි. එසේ දත හැකි ද නොවේ. සෑම දැනීමක් ම ස්වසංවේදී වෙයි. විඥානයේ එක් කෘත්‍යයක් අනතුරු කෘත්‍යය මඟින් දැනගත යුතු වේ නම් පූර්වක්‍ෂණය තවදුරටත් විඥානයක් යයි කිව නොහැකි ය. අනන්තර ක්‍ෂණය මගින් විඥානය ඇතිවන විට පූර්වක්‍ෂණය විනාශ වී ඇති නිසා ය. ඥාතෘ දැන ගන්නා විය යුතු ය. එවිට එය නැවත දැන ගත යුතු වීමේ අවශ්‍යතාව ද නැති වෙයි. ඥානය වූ කලී ස්වසංවේදී බැවිනි. ඥානය තමාවම ප්‍රකට නොකෙරේ නම් එය විෂය වස්තුවෙන් මුළුමනින්ම දුරුව සිටින්නක් විය යුතු ය. ආලෝකය විෂය වස්තු ප්‍රකට කරයි. නමුත් එම ආලෝකය වෙනත් ආලෝකයකින් ප්‍රකට කළ යුතු වෙයි නම්

එම ආලෝකවත් කිරීමේ ව්‍යාපාරයෙහි අවසානයක් නැති වෙයි. එහි ප්‍රතිඵලය වන්නේ කිසිම දෙයක් නිරාවරණය නොවී පැවතීමයි. දැනීම යනු තත් ක්ෂණයෙහිම එම දැනීම පිළිබඳවම සංඥා සහගත වීමයි.

බාහිර විෂය වස්තුන්ගේ වාස්තවිකත්වය පිළිබඳ සංකල්පය බෙහෙවින් තහවුරු වූවකි. සාමාන්‍ය මනසට පුරුදු වී ඇත්තේ කිසිදු මානසිකත්වයකට සම්බන්ධ නැති වාස්තවික වශයෙන් සත්‍ය වූ විෂය වස්තු ඇත්ත වශයෙන්ම පවත්නා බව දැකීමට ය. එබැවින් සත්වාදී මතය පහසුවෙන් බැහැර කළ හැකි නොවේ. එහෙත් එය පසුතැවීමකින් තොරව ඉවතලිය යුත්තක් බව විඥානවාදීන්ගේ අදහස යි. ඔවුනට අනුව විෂයවස්තු වූ කලී විඥානයෙන් බැහැර වූ දේ ලෙස පෙනී යන නමුත් ඒවා නිසැකවම විඥානය මඟින් තමාගේම නිර්මාණයන් ලෙස ඉදිරිපත් කරන දේයි. (**යදන්තර්ඥෙයරූපම් තු බහිර්ත් අවභාසාතෙ.**)

මෙයට අමතරව සත්වාදී දර්ශනය මත, විඥානවාදය හමුවේ නිර්මාණය වන්නා වූ ගැටලු කිහිපයක් සඳහා විඥානවාදීහු දක්වන ආකල්පයන් පිළිබඳ විඥප්තිමාත්‍රතා සිද්ධිවාදය තුළ දක් වේ. එහි දී ඔවුන් හමුවේ වූ ප්‍රධාන ගැටළු 04ක් නිර්මාණය වී ඇත.[14]

01. දේශ නියමය පිළිබඳ ගැටලුව

02. කාල නියමය පිළිබඳ ගැටලුව

03. සන්තාන අනියමය පිළිබඳ ගැටලුව

04. කෘත්‍ය ක්‍රියා පිළිබඳ ගැටලුව

දේශ නියමය පිළිබඳ ගැටලුව ස්ථානගත නියමය සහ ඉන්ද්‍රියානුභූතියට විෂය වන වස්තුව පිළිබඳ නියමය මත බැඳී පවතී. හිරු, සඳු පිළිබඳව ගොඩනැගෙන ඥානය ආකාසය නැමැති ස්ථානය මුල් කොටගෙන ද, පාෂාණ පිළිබඳ ඥානය පෘථිවිය නැමැති ස්ථානය මුල්කොටගෙන ද ගොඩනැගේ. බාහිර විෂය පිළිබඳ අස්ථිත්වයක් නොමැති නම්, හුදෙක් එය ප්‍රඥප්තියක්, පරිකල්පිතයක් පමණක් නම් හිරු, සඳු, ගස්, ගල්, කඳු ආදිය පිළිබඳ ඥානය සැමතැන ම තිබිය යුතු ය. නමුත් එය එසේ නොවේ. හිරු පිළිබඳ ඥානය ආකාසය ම ස්ථාන කොට පවතී.

කාල නියමය පිළිබඳ ගැටළුව ද මෙහා සමාන වූවකි. කිසියම් විෂයක් සම්බන්ධව ඇතිවන ඥානය යම්කිසි කාලයක් තුළ සිදු වේ. සූර්යාලෝකය පිළිබඳ ඇතිවන ඥානය දහවල් කාලය තුළ සිදු වේ. චන්ද්‍රයාගේ රශ්මිය විහිදීම රාත්‍රියේ ම සිදු වේ. මෙහි දී බාහිර වාස්තවිකත්‍වය අසත්‍ය නම් කාල නියමය සැමවිට ම ඇතිවිය යුතු ය. එයට නියමිත වූ කාලයක් නියම කළ නොහැක.

සන්තාන අනියමය මෙහි දී ඇති වූ තවත් ගැටලුවකි. දේශයෙහි හා කාලයෙහි සිටින සියලු දෙනාගේ චිත්ත සන්තානයෙහි වස්තු පිළිබඳ වැටහීම වේ. තනි පුද්ගලයෙකු තුළ පමණක් එම වැටහීම සිදු නොවේ. තිමිර රෝගයෙන් පෙළෙන්නාවූ සත්ත්‍වයන්ගේ සන්තානයෙහි සැබෑ වශයෙන් නොපවත්නා කෙස් සඳ මඬල ආදිය පිළිබඳව වැටහීම වේ. පාප කර්මයන්ගේ ප්‍රතිඵලයක් ලෙස අපායගාමී වන සත්ත්‍වයන් විෂයෙහි සැරව පිරුණු ගංගා, ආයුධ ගත් නිරය පල්ලන් ආදිය පිළිබඳ

අනුභූතිය වේ. සැරව පිරුණු ගංගාවන් සහ නිරය පල්ලන් අසත්‍ය නම් සන්තානයෙහි ඔවුන් පිළිබඳ ඇති වූ වැටහීම පමණක් අභිමත වන්නේ කෙසේ ද?

එසේ ම කෘත්‍ය ක්‍රියා පිළිබඳ ගැටළුව තුළ වස්තු අභාවයේ දී වුව ද කෘත්‍ය ක්‍රියා සිදුවන අයුරු දක්වා ඇත. ස්වප්න අවස්ථාවේ දී ස්ත්‍රී පුරුෂ සංයෝගයෙන් තොරව ද ශුක්‍ර විසර්ජනය සිදු වේ. මෙහි දී ශුක්‍ර විසර්ජන ක්‍රියාව සිදු වුවත් එයට විෂය වන ස්ත්‍රී පුරුෂ සන්යෝගය අසත් වේ.[15]

විඥප්තිමාත්‍රතා දර්ශනය විෂයෙහි ඇති වූ මෙම ගැටළුවලට විඥානවාදීහු ලබා දෙන්නා වූ පිළිතුරු තුළ විඥප්තිමාත්‍රතා සංකල්පය දාර්ශනික වශයෙන් විග්‍රහ වී ඇත. විඥානවාදීන් විෂය අභාවයේ දී දේශකාල නියමයන් සිද්ධ නොවේ යැයි නොකිව යුතු බව දක්වන අතර, එම නියමයන් ස්වප්නයේ දී මෙන් සිදුවන බව පෙන්වා දෙයි. සිහිනයෙන් දක්නා ආරාම, ස්ත්‍රී, පුරුෂ ආදීහු සෑම ප්‍රදේශයක දී ම දක්නට නොලැබෙති. ඒ ඒ ප්‍රදේශවල දී දක්නට ලැබෙන සිහින එකිනෙකට වෙනස් වේ. එම නිසා සිහිනෙන් දක්නා දේ පිළිබඳ දේශ නියමය ඇත. එසේ ම සෑම දිනයකදී ම ස්වප්න දර්ශනය සිදු නොවේ. සමහර දිනෙක පමණක් එය සිදු වේ. එම නිසා ස්වප්න දර්ශනය පිළිබඳ කාලනියමය සිද්ධ ය.

මීට අමතරව සන්තාන අනියමය පිළිබඳ ගැටළුවේ දී එය ප්‍රේතයන් පූය නදිය දක්නාක් මෙන් සිදුවන බව පෙන්වා දෙයි. ඒවා විෂයන්ගෙන් තොරව සිදු වෙයි.[16] සියලු සමාන පාප කර්ම විපාක ඇති ප්‍රේතයෝ සැරව පිරුණු ගංගාවන්, දඬු, කඩු ආදිය දරන නිරය පල්ලන් දකිති. සෑම ප්‍රේතයෙකුට ම මේවා වැටහේ. එනමුත් එබදු විෂයයක් විඥානවාදය තුළ අභිමත නොවේ. කර්ම විපාකයන් ඇති නිරය තුළ කර්ම විපාකයෙන් තොර නිරය පල්ලන්ගේ අස්ථිත්වය යෝග්‍ය නොවේ.

කෘත්‍ය ක්‍රියාව ද විෂය අභාවය තුළ සිදු විය හැකිබව සවප්නෝපඝාත උපමාන වශයෙන් ගෙන දක්වයි.[17] සිහිනයේ දී ස්ත්‍රී පුරුෂ සමාගමයෙන් තොරව ශුක්‍ර විසර්ජනය සිදුවීම ස්වප්න උපඝාතය යි. මෙහි දී බාහිර විෂය විඥප්තියකි. සැබැවින් ම සිහිනයක දී දකින ස්ත්‍රී පුරුෂයන් වාස්තවිකත්වය තුළ අසත්‍ය ය. එනමුත් විඥප්තිමාත්‍රය තුළ කළ යුතු ක්‍රියාවන් සිදු වේ. එනම්, ශුක්‍ර විමෝචනය යි.

විඥප්තිමාත්‍රතා සංකල්පය තුළ යම් වස්තුවක් පිළිබඳ විඥානයක් විෂය අභාවයෙන් ගොඩනැගෙන්නේ නම්, එය ස්වප්නයේ දී පමණක් බව දක්වයි. විෂය සහිතව විඥානයක් ගොඩනැගෙන්නේ නම් එහි දී කරුණු 02ක් සම්පූර්ණ විය යුතු බව ඔවුන් දක්වයි.

01. ඉන්ද්‍රිය හා විෂය සන්නිකර්ෂණය

02. මනස මගින් එහි දැනීම

මෙහි දී ප්‍රථම ක්‍ෂණයේ දී ඉන්ද්‍රිය මගින් ඉන්ද්‍රියාර්ථ සන්නිකර්ෂණය සිදු වේ. දෙවනුව ක්‍ෂණයක් තුළ මනස මගින් ඒ පිළිබඳ දැනීම් කාර්යය සිදුකරයි. ඉන්ද්‍රියාර්ථ සන්නිකර්ෂණය තුළ මනස මගින් කරන්නා වූ මෙනෙහි කිරීම සිදු නොවේ. මනස මගින් මෙනෙහි කරන විට ඉන්ද්‍රිය මඟින් වන්නා වූ විෂය අනුභූතිය ද සිදු නොවේ. එනම් ක්‍ෂණ දෙකක් එකට පහළ නොවන බැවිනි. මෙම නිසා ප්‍රත්‍යක්‍ෂයක් සිදුවිය නොහැක. ප්‍රත්‍යක්‍ෂයක් තුළ බාහිර වස්තුවේ අභාවය වන බැවින් සියලු බාහිර වස්තු අසත්‍ය වේ. එය මිත්‍යාවකි. හුදු විඥප්තියක් පමණි.[18]

සියල්ල විඥප්තියක් වූ විට කිසිවෙකු විසින් තවත් කිසිවෙකු මරා දැමීම කෙබඳු වන්නේ ද? එහි දී ඇති වන්නා වූ පාපය කුමක් නිසා ඇති වේද? යන ගැටලුව ද විඥානවාදීන් හමුවේ ඇති වූ තවත් ගැටලුවකි. මෙයට පිළිතුරක් ලෙස විඥානවාදීන් දක්වන්නේ හිංසකයා සහ හිංසාවට ලක්වන තැනැත්තා පිළිබඳ හිංසා ක්‍රියාව වෛඥානිකත්‍වයට අදාළ වන බව යි. මෙහි දී හිංසකයෙක් හෝ හිංසාවට පත්වන තැනැත්තෙක් නොමැත. හිංසාව යනු එක් විඥප්තියකින් අනෙක් විඥප්තියට බලපෑමක් ඇති වීම යි. එක් විඥප්තියක් දෙවැනි විඥප්තිය කෙරෙහි බලපෑම් කරන විට ජීවිත විරෝධී ක්‍රියාවක් සිදුවිය හැක. එයින් ''සභාග සන්තති විච්ඡේදය'' සිදු වේ. එයට මරණය යැයි කියනු ලැබේ. මනසෙහි ශක්තියෙන් මනුෂ්‍ය ඝාතන ආදිය සිදුවන බව මෙයින් සනාථ කොට දක්වයි. පිශාචාදීහු මෙන්ම මනස දියුණු කළවුන් මානසික ශක්තියෙන් මිනිසුන්ට සිහින පෙන්වති.[19] භූතාවේෂ වීම් ආදිය සිදු කරති. වස්තුවක් නොමැති වූවත් මනස මගින් එම සිද්ධීන් සිදු කරන බව මෙහි දක්වා ඇත. එහෙයින් හිංසනාදී ක්‍රියාවන් වෛඥානිකත්‍වය තුළ අර්ථවත් වන බව විඥප්තිමාත්‍රතාසිද්ධියෙහි දක්වා ඇත.[20]

යෝගාචාරීන් ඉදිරිපත් කරනු ලබන මනස සහ භෞතික වස්තූන් අතර සිදුවන ක්‍රියාවලිය ආචාර්ය ශංකර විසින් විවේචනය කරයි. එයට හේතුව වනුයේ ප්‍රත්‍යක්ෂ අනේකත්වයට හේතු දැක්වීමට නොහැකි වීම යැයි ප්‍රකාශ කරයි. ශංකර ජීවත් වූ කාලයෙහි නූතන භෞතික විද්‍යාව සම්බන්ධ න්‍යායන් සොයාගෙන නොතිබුණි. මෙහි දී භෞතික විද්‍යාවෙහි න්‍යායන් සහ ආභිධම්මික විග්‍රහයෙහි නිර්ණායකයන් පදනම් කොට ගනිමින් ශංකර පිළිතුරක් ලබාදීමට අපේක්ෂිත ය. අභිධර්මයෙහි පරමාර්ථ ධර්ම විග්‍රහ කරන තැන සිත්වල සහ රූපයන්හි ආයුෂ විස්තරයෙහි සඳහන් වන චිත්තක්ෂණ මගින් එක් චෛතසිකයක් ඇතිවීමට ගතවන කාලය ඇසිපිය හෙලන මොහොතින් ලක්ෂයෙන් පංගුවක් ලෙස විස්තර කොට තිබේ. එම කාලය පිළිබඳ පදනමින් ශංකරයන්ගේ තර්කය නිෂ්ප්‍රභ වෙයි.

ශංකර විසින් ඉදිරිපත් කරනු ලබන තර්කය සැකවින් මෙසේ පෙළගැස්විය හැකිය.

A- යෝගාචාරීන්ගේ මනස සහ භෞතික ක්‍රියාවලිය සම්බන්ධයෙන් ප්‍රත්‍යක්ෂ අනේකත්වයට හේතු දැක්වීමට අපොහොසත් වෙයි.

B- අප විසින් හිරු බැස්මක් විඳින විට ශබ්දය කෙසේ විස්තර කළ හැකි ද?

C- භෞතික දේවල් සහ සංකල්ප එකට ඉදිරිපත් කරනු ලබන්නේය කීමෙන් ඒවා එකක් යැයි කිව නොහැකි ය.

D- සියලු ප්‍රජානන සංධාරයෙන් තොරව හිස් වන්නේ නම් භෞතික දේවල් නැතැයි ගම්‍යවන අතර විඥානය ද හිස්වන්නේ ය.

ශංකරගේ තර්කය සමීකරණයකින් මෙසේ ඉදිරිපත් කළ හැකිය.

A= B = C = D {ශංකරගේ තර්කය}

ශංකරගේ තර්කය අනුභූතිවාදීව හා විද්‍යාත්මකව පැහැදිලි කරගත යුතුය. ඔහුගේ තර්කයේ C යන නිදසුනට අනුව චක්ඛු විඥානය මගින් ඇති කරනු ලබන සංජානනයෙන් මනස මුහුදු වෙරළෙහි

දර්ශනය විදිමින් සිටිය දී ශ්‍රෝත්‍ර විඥානය මගින් ගෙන එනු ලබන ශබ්දය එකම ක්‍ෂණයක ගෝචර වනුයේ කාලාන්තරය තප්පරයකින් ලක්ෂ්‍යකින් පංගුවට (Nano Second) වඩා වැඩිවන බව විද්‍යාත්මකව සනාථ කර ඇති බැවිනි. ශංකරගේ තර්කය ප්‍රතිතර්කයක් මගින් මෙසේ නිෂ්ප්‍රභ කළ හැකිය. අකුණු සැරයක් ඇති වන විට ආලෝකය සහ ශබ්දය පසුවත් දිස්වන්නේ ය. එය මායාවක් නොවේ. එය සෛද්ධාන්තිකව භෞතික විද්‍යාවෙහි පිළිගත් සත්‍යයකි. ශබ්දයේ වේගයට වඩා වැඩි වේගයකින් (තත්පරයට 186000KM) ගමන් කරයි. මේ නිසා චිත්තක්‍ෂණය අතර ඇති කාලපරාසය තුළ ශබ්දය ඇසීම සංදර්ශනය දැකීම යන අවස්ථාද්වයම එකක් පෙනෙන පරිදි මනසේ අවස්ථා දෙකක දී ඇති විය හැකිය. චිත්‍රපටියක සෙලෝලයිට් රූප රාමුවක අඩුම වශයෙන් රාමු තිහකින් තත්පරයක් තුළ තිරය මත ප්‍රක්‍ෂේපනය වීමෙන් සාමාන්‍ය දර්ශනයක් අපට නැරඹිය හැකිය. එය මෙසේ වනුයේ අපගේ ඇසට මෙම රාමු තිහෙන්ම අඛණ්ඩ ලෙස දර්ශනය ලැබෙන නිසාය. එහෙත් සත්‍ය වශයෙන් තත්පරයෙන් ඉතා සුළු කාලයක් අප බලා සිටින්නේ රූප රාමු දෙස ය. එහෙත් එය අපට නොපෙනේ. මෙහි දී අප විසින් කලින් දක්වන ලද සමීකරණය දෙස බලන විට A=B=C=D අප විසින් බිඳ හෙලන ලද තර්කය වන අතර, එහි අගය (A=0) ලෙස නිශේධනය වන විට ඔහුගේ සියලු තර්කය නිශේධනය වේ.

ශංකර විසින් යෝගාචාර විඥානවාදී විග්‍රහයට එරෙහිව ඉදිරිපත් කරන තවත් තර්කයක් වනුයේ සිහින අත්දැකීම සහ පුබුදු අත්දැකීම දෙකක් මිස එකක් නොවන බවයි. ඔහු පවසනුයේ සිහිනෙන් අප ගමනක් ගියහොත් අප අවදි වන විට අප සිටිය යුත්තේ ඒ ගමන කෙළවර වූ ස්ථානයේ බවයි. මෙයින් ඔහු අදහස් කරනුයේ සිහින අවස්ථාව මනසෙහි වෙනස් ආකාරයක ක්‍රියාකාරීත්වයක් බවයි. එහෙත් යෝගාචාරීන් පවසනුයේ එය දෙකක් නොව එකක්ම බවයි. එය සත්‍යයක් වන අතර ශංකරගේ තර්කය ඉතා ලාමක එකක් ලෙස නූතන මනෝ විද්‍යාව මගින් සනාථ වේ. ඒ අනුව සිහිනවල එක් අවස්ථාවක් වන (sleep walking) නම් සිහින අවස්ථාවේ එය දකින පුද්ගලයා සැතපුම් ගණනක් වුව ද ඇවිදගෙන යන අතර, එහි දී ක්‍රියාකාරී වන්නේ ස්වප්න අවස්ථාව යි. මෙය නූතන වෛද්‍ය විද්‍යාව තුළින් ද සනාථ කොට ඇති සත්‍යයකි. එම සංකීර්ණ ක්‍රියාවලිය මිනිස් මනස මුල් කොට සිදුවන්නක් බව සනාථ කළ හැකිය. ශංකර් ඉදිරිපත් කරනු ලබන තෙවැනි තර්කයක් නම් ''කණුවක් හෝ තාප්පයක් ප්‍රත්‍යක්‍ෂ කරනු ලබන විට තම ප්‍රත්‍යක්‍ෂ පිළිබඳ පමණක් සවිඥාන වන කෙනෙක් නැත යන්න ය.'' අප සවිඥාන කරනුයේ කණුව හෝ තාප්පය වැනි ප්‍රත්‍යක්‍ෂ විෂය ගැන ය. නිදසුනක් ලෙස අප රථයක නැග ගමන් කරන විට රථයේ වේගයට අනුව අපගේ දෘෂ්ටියෙහි ගැටෙන වස්තුව අප පසු කර යන බව පෙනේ. එවිට අප ගමන් කරන රථයේ වේගයට සාපේක්‍ෂව අපගේ ඇසෙහි වූ කාච වලට ආලෝක කිරණ වල වේගය ක්‍රමයෙන් සීඝ්‍ර වනවිට, එනම් රථයේ ත්වරණය (acceleration) වැඩි වන විට ඒවා තනි තනි වශයෙන් නොව සමූහයක් වශයෙන් හෝ මිශ්‍රණයක් ලෙස දිස් වන්නට පටන් ගනී. එහෙත් ශංකර එවන්නක් ගැන සිතා නැත. ඒ අනුව ඔහු නිශ්චල වස්තූන් ගැන සිතා ඉහත නිගමනයට එළඹ තිබේ. ශංකර සිටි යුගයේ දී ගමනාගමනය නොදියුණුවක පැවතීම හේතුවෙන් ඔහුට ඉහත මතයට එළඹෙන්නට ඇත.

යෝගාචාර විඥානවාදයට එරෙහි ව ඔහුගේ සිව් වැනි තර්කය වූ කඹය සර්පයකු යැයි වරදවා තේරුම් ගැනීම සම්පූර්ණ තර්කයක් නොවේ. එය සම්පූර්ණ වීමට නම් එහි ප්‍රතිතර්කයක් වූ සර්පයකු දුටු විට එය කඹයක් ලෙස පෙනීමට ද ඉඩ තිබේ. මෙහි දී ශංකර පවසන බාහිර වස්තූන්ගේ

පිහිටීම යෝගාචාරීහු කිසිදු විට ප්‍රතික්ෂේප නොකරති. ඔවුන්ගේ තර්කය වනුයේ එකම කඹය හෝ එකම සර්පයා දෙස අනිත්‍යතාවය නිසාවෙන් නැවත වරක් බැලිය නොහැකි බවයි. එනම් ඒවා සංස්කාර වශයෙන් ගත් කළ පරිණාමය වෙමින් පවතින බවයි. ඒ නිසා එැනි තර්කයක් ඉදිරිපත් කිරීමෙන් පෙනී යන්නේ ශංකර් යෝගාචාරීන්ගේ දර්ශනය නිවැරදිව අවබෝධ නොකොට එවැනි තර්කයක් ඉදිරිපත් කොට ඇති බවයි.

වසුබන්ධු හිමියන් ඉදිරිපත් කරනු ලබන වැදගත් අදහසක් නම් දන්නා දෙය මෙන්ම දන්නා තැනැත්තා යනු දෙකක් නොව එකම සත්තාවක් යන්න ය.[21] මෙම අවස්ථාද්වයම විඥානයෙන් ප්‍රභවයවන බව ඔහුගේ මතය යි. විඥානයෙහි පහළවීමෙන් ඉහත අවස්ථාද්වයම පහළවන අතර, එම අවස්ථාවන් යථාර්ථවත්ව අවබෝධ කිරීමෙන් බුද්ධත්වයට පත්විය හැකි බව සඳහන් කොට තිබේ. ඒ අනුව සියල්ල විඥානයෙහි යම් යම් ස්ථරයන් පදනම් ව බිහිව ඇත. සිහිනය එහි එක්තරා ස්ථරයක් වන අතර, අවදි වූ පමණින් එය අවබෝධ වෙයි. ලෞකිකත්වය අවබෝධ කරගත හැක්කේ ලෝකෝත්තර තත්වයට පත් වූ පසුය. ලෞකික ලෝකයෙහි සම්භවය වන සියලු දුක්වේදනා ලොකෝත්තර තත්වයේ දී නිෂේධනය වෙයි. අප ලෝකෝත්තරත්වය අවබෝධ කර නොගැනීමෙන් ලෞකික ලොව අසාර වූ ප්‍රපංචයන්ගෙන් කැළඹී ඇත. එබඳු පසුබිමෙන් මිදීමට ලංකාවතර සූත්‍රය සහ විඥප්තිමාත්‍රතාවාදය ප්‍රකාශ කරනුයේ ආලය විඥානයෙහි වූ ක්ලේශයන් නැතිකර දැමීම ය.

ස්ථිරමති ආචාර්යන් වසුබන්ධුගේ විඥප්තිමාත්‍රතා සිද්ධිවාදයට තිංශතිකාව රචනා කරමින් මිනිසුන් මායාත්මක ලෝකයකින් ආවරණය වී සිටීමට දුක්ඛ සම්භවයට මුල් වන්නා වූ කාරණාද්වයක් ඉදිරිපත් කරයි, එනම් ආත්මෝපචාරය සහ ධර්මෝපචාරය යි.[22] ක්ලේශාවරණ සහ ඥෙයාවරණ ප්‍රහීණ නොකිරීමෙන් යථෝක්ත උපචාර උද්ගත වෙයි. ක්ලේශාවරණ සහ ඥෙයාවරණ ප්‍රහීණ කිරීමට අවස්ථාද්වයක් කෙරෙහි අවධානය යොමු කළ යුතුය. එනම්,

i. පුද්ගල නෛරාත්මය
ii. ධර්ම නෛරාත්මය

පුද්ගල නෛරාත්මය හෙවත් පුද්ගලයා ආත්මීය වශයෙන් නොගැනීමෙන් පුද්ගල නෛරාත්මය මතුවන අතර, ඉන් සක්කාය දෘෂ්ටිය ප්‍රහීණ වෙයි. ධර්මය ආත්මීය වශයෙන් නොගැනීම හෙවත් ධර්ම නෛරාත්මයෙන් අවිද්‍යාව ප්‍රහීණ වෙයි. සක්කාය දෘෂ්ටිය සහ අවිද්‍යාව දුරුවීම කරණකොට මායාමය ලෝකයෙන් මිදීමත් යථාර්ථයේ පිබිදීම නම් බුද්ධත්වය අවබෝධ වෙයි. ක්ලේශාවරණයෙන් සිදුවනුයේ කෙලෙස් ආවරණය කිරීමයි. ඥෙයාවරණයෙන් සිදුවනුයේ නුවණ ආවරණය කිරීම යි. ඉහත අවස්ථාද්වයම යථාර්ථය විරුද්ධ ය. යෝගාචාරීන් පුද්ගල සහ ධර්ම ආත්මීය වශයෙන් නොගැනීමෙන් මුල් බුදුසමයෙහි විග්‍රහයට පැමිණ තිබේ. වසුබන්ධු හිමියන් විඥප්තිමාත්‍රතාවාදය තුළින් මායාවෙන් මිදීම හෙවත් යථාර්ථයෙහි පිබිදීම සියුම් ව ඉදිරිපත් කොට තිබේ.

ලෝක විෂය විඥප්තියක් බව ප්‍රකාශ කිරීමේ දී විඥානවාදීහු ලෝකය සහ සත්වයා ත්‍රිවිධ ස්වභාවයකින් විග්‍රහ කිරීමට යොමු වී ඇත. එනම් පරිකල්පිත, පරත්‍ර සහ පරිනිෂ්පන්න යන ස්වභාවත්‍රය යි.

## පරිකල්පිතය ස්වභාවය

''පරිකල්පිත ස්වභාවය'' යනු ලෝකයෙහි පවත්නා වස්තු පිළිබඳ සත්‍ය අවබෝධ නොකළ සත්වයන් විසින් තම සිතෙහි මවාගනු ලබන විකල්පිත වූ අවස්ථාවකි. පුද්ගලයා තම තමන්ට ආවේණික වූ සිතුම්, පැතුම් අනුව තමන් අරමුණු කරන ලෝකය පිළිබඳ සංකල්ප නිර්මාණය කරගන ලබයි.[23] ඒ සියලුම අදහස් කල්පනා පරිකල්පිත ස්වභාවය යැයි ද එය යථාර්ථ වශයෙන් ලෝකයේ විද්‍යමාන නොවන බව ද යෝගාචාරීහු පෙන්වා දෙති.[24] යෝගාචාර විඥප්තිමාත්‍රතාවය මෙම පරිකල්පිත අවස්ථාවෙන් පිළිබිඹු වේ.

## පරතන්ත්‍රය ස්වභාවය

''පරතන්ත්‍ර ස්වභාවය'' යනු පරිකල්පිත ලෝකය පිළිබඳව සාමාන්‍ය පුද්ගලයෙකු දකින තත්ත්වයට වඩා නුවණින් දැකීමෙන් පහළ කරගන්නා සිතුවිලි ය. මෙය ප්‍රත්‍යක්ෂයෙන් උපදින විකල්පයක් බව විඥානවාදීහු දක්වති.[25] මෙහි විකල්ප ශබ්දයෙන් පරතන්ත්‍ර ස්වභාවය ම අදහස් කරනු ලබන අතර, ප්‍රත්‍යයන්ගෙන් හටගන්නා වූ අරුතින් පරතන්ත්‍ර නම් වේ. මෙහි ප්‍රත්‍ය වනුයේ පරිකල්පිතය යි. පරතන්ත්‍ර අවස්ථාවේදී ද ලෝකය පිළිබඳ යථාර්ථය පිළිබිඹු නොවේ.

## පරිනිෂ්පන්නය ස්වභාවය

''පරිනිශ්පන්න ස්වභාවය'' යනු යථාර්ථ දර්ශනය යි. මෙය ''තථතාවය'' ලෙස යෝගාචාරීන් දක්වයි. මෙය තුළින් විකල්පය, අභූත පරිකල්පනය නිෂ්පන්න වේ.[26] මෙහි දී ඉහත විග්‍රහ වූ පරිකල්පිත සහ පරතන්ත්‍ර ස්වභාවයන්ගෙන් පරිනිෂ්පන්න ස්වභාවය හැම කල්හි ම තොර වේ. ලෝකය සහ සත්ත්වයා පිළිබඳ විඥප්තිමාත්‍රත සංකල්පය මෙම අවස්ථාවෙන් අර්ථවත් වේ.

මෙම ත්‍රිවිධ ස්වරූපය නිදසුනකින් පෙන්වා දෙන යෝගාචාරීහු කඹයක් දැක, එය සර්පයෙකු ලෙස වරදවා සිතන අවස්ථාව පරිකල්පිත ස්වභාවය ලෙස ද, එම කඹය, කඹයක් ලෙස දැකීම පරතන්ත්‍ර ස්වභාවය ලෙස ද, කඹය යනු විකල්පිතයක් මිස, එහි යථාර්ථයක් නොවන බව අවබෝධ කොට ගැනීම පරිනිෂ්පන්න ස්වභාවය ලෙස ද දක්වා ඇත.

1 යථාහි අංගසම්භාරො - හොති සද්දොරථො ඉති
එවං ඛන්ධෙසු සත්තෙසු - හොති සත්තොති සම්මුති

2 සර්වං සර්වදා අස්තීති සර්වාස්තිවාදඃ

3 ක්‍ෂණිකානං නාස්ති දෙශාන්තර ගමනං - යත්‍රෛවෝත්පත්තිඃ තත්‍රෛව විනාශඃ
(අභිධර්මකෝෂ ටීකා, 165 පිට)

4

- අස්තීති ශාස්වතග්‍රාහො - නාස්තීත්‍යුච්ඡේද දර්ශනං
  තස්මාදස්තීත්ව නාස්තිත්වෙ - නාශ්‍රීයතෙ විචක්‍ෂණඃ
  (මූලමාධ්‍යමිකකාරිකා - ශාසනරතන සංස්කරණය - 160 පිට)

- යඃ ප්‍රතීත්‍ය සමුප්පදඃ - ශූන්‍යතාං තාං ප්‍රචක්‍ෂමහෙ
  සා ප්‍රඥප්තිරුපාදාය ප්‍රතිපත්සෛව මධ්‍යමා
  (මූලමාධ්‍යමිකකාරිකා - ශාසනරතන සංස්කරණය - 160 පිට)

5 විඥප්තමාත්‍රමෙවෛත - දසදර්ථාව භාසනාත්
යථා තෛමිරිකස්‍යාසත් කේශචන්‍ද්‍රාදී දර්ශනම්
ඤාණසීහ ස්ථවිර, හේන්පිටගෙදර, විඥප්තිමාත්‍රතා සිද්ධිවාදය, සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සමාගම, 1964.

6 සෛව චාස්‍ය භවේද්භ්‍රාන්තිරශුද්ධං තිමිරං යථා
කොශෝචන්‍ද්‍රකං තෛමිරිකො යථා ගෘහාති විභ්‍රමාත්
විෂයෙෂු තද්වද්වාලානං ගෘහණං සංප්‍රවර්තතෙ
කෙශොණ්චන්‍ද්‍රකප්‍රඛ්‍යමිදං මරීච්‍යුදකවිභ්‍රමම්
සද්ධර්මාලංකාවතාර සූත්‍ර

7 දර්පණෙ උදකෙ භාණ්ඩෙෂු ච මණීෂු ච
බිම්බං හි උද්‍යතෙ තේෂු න ච බිම්බෝස්ති කුත්‍රචිත්
භාවාභාසං තයා චිත්තං මෘගතෘෂ්ණා යථා නභේ
තස්‍යතෙ චිත්‍රරූපෙණ ස්වප්නෙ වන්ධ්‍යෝරසෝ යථා
සද්ධර්මාලංකාර සූත්‍ර
8 සකෘත් සංවෙද්‍යමානස්‍ය නියමෙන ධියාසහ විෂයස්‍ය තතොන්‍යත්වම් කෙනාකාරන සිද්ධ්‍යති

Pramāna Vārtika by Dharmakîrti.ed. R. Sāmskrtyāí, II, 338

9 The New Realism. P. 35.

10 ***සංවෙදෙනන බාහ්‍යත්වම් අතෙර්ථස්‍ය න සිද්ධ්‍යති. සංවේදනාත් බාහිරත්වෙ ස එව නතු සිද්ධස්‍ය***
Pramāna Varlikālankāra by prajńākaragupta ed. R. Sāmskrtyāna, patina, P. 32.
11 න ච විෂය ප්‍රතිභාසාත්ම උත්පත්තිම් මුක්ත්වා විඥාස්‍යාන්‍ය ක්‍රියාසති

Madyānta vibhāga Sutrabhāsyatika. by Sthiramati, part 01, ed. V. Bhattacarya, 1932. P. 21.

12 Pramana Vārtika by Dhammakirti.
ed. R. Sāmskrtyāyana. II. P. 361-63

13 බහු චිත්තාලම්බනීභූතං එකං වස්තුසාධාරණම්
තත් බලු නෛකචිත්ත පරිකල්පිතං
යෝග සූත්‍ර භාෂ්‍ය, පි. 15.

14 යදි විඥප්ති රනර්ථා - නියමො දෙශකාලයොඃ
සන්තානස්‍යානමශ්ච - යුක්තා කෘත්‍යක්‍රියා න ච
**විඥප්තිමාත්‍රතාසිද්ධි, විංශතිකා කාරිතා, 2 ශ්ලෝකය.**

15 කිමුත්තං භවති. යදි විනා රූපාද්‍යර්ථෙන රූපාදී විඥප්ති රුත්පද්‍යතෙ න රූපාද්‍යර්ථාත්. කස්මාත් ක්වචිත් දේශ උත්පද්‍යතෙ. න සර්‍වත්‍ර? තත්‍රෛව දෙසෙ කදාචි දුත්බපද්‍යතෙ. න සර්‍වදා. තද්දෙශකාලප්‍රතිශ්ඨිතාන සවේෂාං. කස්මාන් යත් තෛමිරිකෛඃ කෙශභ්‍රමරාදි දෘෂ්‍යතෙ. තෙන කෙශාදි ක්‍රියා න ක්‍රියතෙ. න ච තදන්‍යෛර න ක්‍රියතෙ යදන්ත පානවස්ත්‍රවිෂායුධාදි ස්වප්නෙ දෘෂ්‍යතෙ. තෙනාන්නාදික්‍රියා න ක්‍රියතෙ. න ච තදන්‍යෛර් තක්‍රියතෙ. ගන්ධර්වනගරෙණා සත්වාන් නගරක්‍රියා න ක්‍රියතෙ. න ච තදනෛර් න ක්‍රියතෙ තස්මා දර්ථාභාවෙ දෙශකාල නියමඃ සන්තානානියමඃ කෘත්‍යක්‍රියා ච න යුජ්‍යතෙ.
**විඥප්තිමාත්‍රතාසිද්ධි, විංශතිකා කාරිකා භාෂ්‍යය, 2 ශ්ලෝකය**

16 දෙශාදිනියමඃ සිද්ධඃ ස්වප්නවත් ප්‍රෙතවත් පුනඃ
සන්තානානියමඃ සර්‍වෛ - පූයනද්‍යාදී දර්ශනෙ
**විඥප්තිමාත්‍රතාසිද්ධි, විංශතිකා කාරිකා. 03 ශ්ලෝකය**

17 ස්වප්නොපඝාතවත් කෘත්‍ය - ක්‍රියා නරකවත් පුනඃ
**විඥප්තිමාත්‍රතාසිද්ධි, විංශතිකා කාරිකා, 04 ශ්ලෝකය**

18 ප්‍රත්‍යක්‍ෂ බුද්ධිං ස්වප්නාදෞ - යථා සා ච යදා තදා
න සොථෞ දෘෂ්‍යතෙ තස්‍ය - ප්‍රත්‍යක්‍ෂත්වා කතං මතම්
උක්තං යථා තදාභාසා - විඥප්තිඃ ස්මරණං තතඃ

ස්වප්නෙ දෘග්විෂයාභාවං - නාප්‍රබුද්ධොවගච්ඡති
අන්‍යොන්‍යාධිපත්‍යෙන - විඥප්තිනියමො මිථඃ
මිද්ධෙනොපහෘතං චිත්තං - ස්වප්නෙ තෙනාසමං ඵලම්
**විඥප්තිමාත්‍රතාසිද්ධි, විංශතිකා කාරිකා, 16,17,18 ශ්ලෝක**

[19] මරණං පරවිඥප්ති - විශේෂාද් වික්‍රියා යථා
ස්මෘතිලොපාදිකාන්‍යෙෂාං - පිශාචාදිමානොවශාත්
**විඥප්තිමාත්‍රතාසිද්ධි, විංශතිකා කාරිකා, 19 ශ්ලෝකය**

[20] තථා පරවිඥප්තිවිශෙෂාධිපත්‍යාත් පරෙෂාං ජීවිතෙන්ද්‍රියවිරොධිනි කාචිද් වික්‍රියොත්පද්‍යතෙ, යයා සභාගසන්තතිච්ඡෙදාඛ්‍යං මරණං භවතීති චෙතදිතව්‍යම්.
**විඥප්තිමාත්‍රතාසිද්ධි, විංශතිකා කාරිකා භාෂ්‍යය, 19 ශ්ලෝකය**

[21] **වික්‍රමසිංහ අනුර එන්. මහායාන බුදු දහමේ සමකාලීන අදාළත්වය, භාග්‍යයා - ගංගොඩ, පිළිමතලාව.**

[22] ආත්මධර්මෝපචාරෝහි - විවිධො යඃ ප්‍රවර්තනෙ
විඥානපරිණාමෙ සෞ - පරිණාමඃ සච ත්‍රිධා
**ඤාණසීහ ස්ථවිර, හේන්පිටගෙදර, විඥප්තිමාත්‍රතා සිද්ධිවාදය - විශංතිකාව, ඇම්.ඩී. ගුණසේන සමාගම, කොළඹ - 1964 - පිටු 159.**

[23] යෙන යෙන විකල්පෙන - යද් යද් වස්තු විකල්ප්‍යතෙ
**විඥප්තිමාත්‍රතාසිද්ධි, ත්‍රිංශතිකා කාරිකා, 20 ශ්ලෝකය**

[24] පරිකල්පිත එවාසෞ - ස්වභාවො න ස විද්‍යතෙ
**විඥප්තිමාත්‍රතාසිද්ධි, ත්‍රිංශතිකා කාරිකා, 20 ශ්ලෝකය**

[25] පරතන්ත්‍රස්වභාවස් තු - විකල්පඃ ප්‍රත්‍යයොද්භවඃ
**විඥප්තිමාත්‍රතාසිද්ධි, ත්‍රිංශතිකා කාරිකා. 21 ශ්ලෝකය**

[26] නිෂ්පන්නස් තස්‍ය පූර්වේණ - සදා රහිතතා තු යා
**විඥප්තිමාත්‍රතාසිද්ධි, ත්‍රිංශතිකා කාරිකා, 21 ශ්ලෝකය**